PERMANENT
REFERENCE
NOT TO BE
REMOVED
FROM THE
LIBRARY

# ශ්‍රී ලංකාවේ ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ පරිපාලනමය ක්‍රියාකාරිත්වය හා කුසලතා පුහුණුව පිළිබඳ විග්‍රහයක්

# An Analysis of Administrative Activities and Training Skills of National Apprentice Board in Sri Lanka.

බී.පී. කරුණාතිලක, B.A.(Hon).,අධ්‍යාපන ඩිප්ලෝමා

උපදේශක කථිකාචාර්ය - ඩී. අරම්පත්ත මහතා.

සංශෝධන උපදේශක කථිකාචාර්ය -

ආචාර්ය ජේ. වනසිංහ මහතා

UCLIB
375929

375929

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

- සාරාංශය -

විශ්වය තුල ඇති වටිනාතම සම්පත වශයෙන් මානව සම්පත සැලකිය හැකි අතර එහි දියුණුව මත රටක සෞභාග්‍යය, රඳී ඇත.

මානව සම්පත රටේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට අනුව පුහුණු කර ගැනීමේ නොයෙකුත් ඌණ තාවයන් නිසා රැකියා වියුක්තිය වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ පා තිබෙන ප්‍රධාන ගැටළුවක් බවට පත් ව තිබේ.

මානව සම්පත දියුණුවට අදාල අන්දමින් පුහුණු කර ගැනීම සඳහා ලෝකයේ විවිධ කාල වල, විවිධ ජාතීන් විවිධ ක්‍රම අනුගමනය කර තිබේ.

ආධුනිකත්ව ක්‍රමය මිනිස් ඉතිහාසය සමග එකට බැඳී ආ එකක් වන අතර වර්තමාන ජාතික ආධුනිකත්ව ක්‍රමය ජාතීන් විසින් ස්වකීය ජාතිය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මිනිස් ශ්‍රමය පුහුණු කර ගැනීම සඳහා යොදන එක් ක්‍රමයක් වශයෙන් හැඳින්විය හැකිය.

යටත් විජිත වශයෙන් තිබී නිදහස ලැබූ රටවල අධ්‍යාපනය ප්‍රායෝගික නොවන න්‍යාය කෙරෙහි බර, ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියට එතරම් පිටු බලයක් නැති යටත් විජිත අවශ්‍යතාවයනට සරිලන කුසලතා ආකල්ප පුහුණු කරන්නක් විය. යටත් විජිත අධ්‍යාපනය සෑම අංශයකින්ම පාහේ දියුණු වෙමින් පවතින රටවල ප්‍රශ්න විසඳීමට නොව තව තවත් ප්‍රශ්න උග්‍ර කිරීමට හේතු විය.

ජනගහනය වැඩිවීම රැකියා වියුක්තිය, අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම පුළුල් වීම, තාක්ෂණ හා තක්ෂිතාර්මික නිෂ්පාදන හිඟය, විදේශ විනිමය හිඟය, ඉඩම් හිඟය, බුද්ධි විගමනය මේ ප්‍රශ්න අතර කැපී පෙනෙන ඒවාය.

ශ්‍රී ලංකාවද මේ සඳහා නොයෙක් අවස්ථාවන් හි දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් වෘත්තිය හා අධ්‍යාපනය සම්බන්ධ කිරීමට ප්‍රයත්න දරා ඇත. නමුත් ඒ එතරම් පියවරක් හෝ එතරම් සාර්ථක වී නැති බව පෙනේ.

වෘත්තිය හා අධ්‍යාපනය සම්බන්ධ කිරීම සම්බන්ධයෙන්, බුරුමය, ඉන්දියාව, මැලේසියාව, පිලිපීනය, තායිලන්තය, සිංගප්පූරුව, එක්සත් සෝවියට් ජනරජය, නේපාලය, බංගලා දේශය, පකිස්ථානය, හා නවසීලන්තය යන රටවල් 1978 වර්ෂයේ කොළඹ දී අධ්‍යාපන ඇමතිවරුන්ගේ සම්මේලනයක් පවත්වා සාකච්ඡා පවත්වනු ලැබිණ.

රටක තාර්මික හා වෘත්තිය අධ්‍යාපනය මත ජනතාවගේ ආර්ථික දියුණුව හා ජීවන තත්වයේ දියුණුව රඳා පවතින බව තාර්මික හා ආර්ථික විද්‍යාඥයෝ විශ්වාස කරති.

ශ්‍රී ලංකාවේ තාර්මික හා වෘත්තිය අධ්‍යාපනය දියුණු කිරීම සඳහා නොයෙකුත් පියවර ගෙන ඇත. පෞද්ගලික අංශයට පමණක් මෙය ඉටු කළ නොහැකි කර්තව්‍යයක් නිසා රජයද එයට සහභාගී විය. කනිෂ්ඨ තාර්මික විද්‍යාල, තාර්මික විද්‍යාල, විශ්ව විද්‍යාල හා රජයේ විවිධ දෙපාර්තමේන්තු මගින් මේ සඳහා වැඩ පිළිවෙල සකස් කර ඇත. එසේ ද වුව මෙම ආයතන කාලීන සාමාන්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීමට පවා අපොහොසත් වූ බව පෙනේ. ජර්මන් ෆෙඩරල් ජනරජය, එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය හා එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු ජනරජය වැනි කර්මාන්ත අතින් දියුණු රටවල් මේ සඳහා සාර්ථක වැඩ පිළිවෙල ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකාවේද මේ සඳහා 1971 පාර්ලිමේන්තු පණතක් මගින් ජාතික ආධුනිකත්ව මණ්ඩලයක් පිහිටුවනු ලැබීන. වර්තමාන හා අනාගත උවමනාවන්ට සරිලන නිපුන කර්මාන්ත ශිල්පීන් පුහුණු කිරීම සඳහා වර්ගීකරණයට භාජන කරන ලද හා වර්ගීකරණයට භාජන නොකළ වෘත්තිය පාඨමාලා සකස් කර රාජ්‍ය හා

පෞද්ගලික අංශයේ සහාය ඇතිව පුහුණු කිරීම් කටයුතු කරගෙන යනු ලැබේ.

ජාතික ආධුනිකත්ව පණතට අනුව ඇමතිවරයාට පුළුල් බලතල හිමිවෙයි. ඔහු විසින් අධ්‍යක්ෂවරයකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලැබෙයි. ආධුනිකත්ව පණතට අනුව ආධුනිකත්ව වර්ග පුහුණුව, ගෙවීම් ආදී කටයුතු ගැන පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලැබෙයි.

ශ්‍රී ලංකාවේ පුහුණු මිනිස් ශ්‍රම හිඟය දීර්ඝ කාලයක් තිස්සේ පැවතගෙන එයි. පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේදී සංවර්ධන කාර්යයට නැඹුරු වීමක් වශයෙන් වැඩ හුරුව හා ප්‍රාග්වෘත්තිය, ආරම්භ කිරීම වැදගත් වෙයි. ඒ සමගම වෘත්තිය හා තාර්මික අධ්‍යාපන අවස්ථා සැලසීම සඳහා විශේෂ විද්‍යාල පිහිටුවීමේ අවශ්‍යතාවය ජර්මන් ෆෙඩරල් ජනරජය හා සෝවියට් දේශය වැනි රට වලින් පැහැදිලි වෙයි. එසේම මේ රටවල වෘත්තිය හා තාර්මික අධ්‍යාපනය ආගමික, සංස්කෘතික හා වින්දනාත්මක අංශ වලින් සම්බන්ධ කර තිබීම ද වැදගත් වෙයි.

බුද්ධි විගමනය, රැකියා ප්‍රශ්නය, උගතුන්ට රැකියා නැතිවීම ආදී විවිධ ප්‍රශ්න වල ට මුහුණ පා ඇති ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තය හා කර්මාන්ත යන අංශ දෙකින්ම සංවර්ධනය කල යුතු වෙයි. මේ සඳහා ගෙන ඇති ප්‍රයත්න සෑහෙන්නේ නැති අතර, ඒ සඳහා ජාතික ආධුනිකත්ව මණ්ඩලය ද ප්‍රතිසංස්කරණය කල යුතු බව පෙන්වා දිය යුතුය.

පැන නැගී ඇති වර්තමාන තත්වය හා අනාගත අපේක්ෂාවන් සඳහා රජය හා ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ සැලකිල්ලට භාජන විය යුතු අදහස් කිහිපයක් වශයෙන්, බුද්ධි විගමනය නැවැත්වීම සඳහා පියවර ගැනීම සඳහා අදාල අංශ වලට දන්වා සිටීම, වෘත්තිය පුහුණුව සඳහා පුනරාවර්තන අධ්‍යාපන ක්‍රමයක් අනුගමනය කිරීම, වෘත්තිය හා අධ්‍යාපනය සම්බන්ධ කිරීම, ප්‍රාථමික අධ්‍යාපනයේ සිට අවිධිමත් අධ්‍යාපනය දක්වා දීර්ඝ කිරීම, ජාතික ආධුනිකත්ව

මණ්ඩලයේ සේවාවන් විමධ්‍යගත කර පුළුල් කිරීම, කෘෂි ධීවර, අංශ ද ඇතුළත් වන පරිදි වෘත්තීය වර්ගීකරණ සංඛ්‍යාව වැඩි කිරීම, ජාතික ආධුනිකත්ව පුහුණුව හා නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීම, මිනිස් බල සැලසුම් කිරීම, ආධුනිකත්ව මණ්ඩලය සතු පුහුණු ආයතන පිහිටුවීම, ආධුනිකත්ව දීමනා වැඩි කිරීම, පෞද්ගලික ව්‍යවසාය සහභාගී කරවා ගැනීම, ප්‍රතිසංවිධාන කිරීම, හා මේ කාර්යයන් සඳහා ගැඹුරින් අධ්‍යයනයක් කිරීම අවශ්‍ය බව පෙන්වා දිය හැක.